# <u>දැන්වීමයි.</u>

## සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය වන නිලධාරීන් වෙත දෙපාර්තමේන්තුව පිහිටුවීමට පෙර ලබාදුන් විනය නියෝගවලට එරෙහිව අභියාචනා ඉදිරිපත් කිරීම.

- 2017 අංක 2 දරන දිවිනැගුම (සංශෝධන) පනතින් සංශෝධිත 2013 අංක 1 දරන දිවිනැගුම පනත අනුව පිහිටුවන ලද සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට ඒකාබද්ධ කරන ලද ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය හා ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය යන ආයතනවල සේවය කරමින් සිටිය දී පූර්ව විනය බලධාරීන් විසින් ලබාදෙන ලද විනය නියෝගයකින් අතෘප්තියට පත් නිලධාරියකුට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීමට අංක අමප/21/0821/304/071 හා 2021.06.15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් දන්වා ඇත.

- ඒ අනුව, <u>පහත අවස්ථාවන්ට අදාල නිලධාරීන්ට</u> **<u>2021.11.25 දිනට පෙර</u>** තම අභියාචනය චෝදනා පත්‍රයේ හා විනය නියෝගයේ පිටපතක් සහිතව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ හැකි බව කාරුණිකව දන්වමි.

I. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව(මුලින් දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව) පිහිටුවන දිනට පූර්වාසන්න මාස 06 ඇතුළත අදාල අධිකාරි තුනෙහි සේවය කරමින් සිටිය දී ලබාදුන් විනය නියෝගයකින් අතෘප්තියට පත් නිලධරයෙකුට;

II. අදාල අධිකාරි තුනෙන් එකක පිහිටුවා තිබූ අභියාචනා කමිටුවක් වෙත අභියාචනයක් නියමිත කාලය තුළ දී ඉදිරිපත් කර ඇති බව සනාථ කළ හැකි හා එම අභියාචනය සම්බන්ධයෙන් අවසන් තීරණයක් ලබා දී නොමැති නිලධරයෙකුට;

III. කම්කරු විනිශවය සභාවක් වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇති බව සනාථ කළ හැකි සහ මෙතෙක් අවසන් නියෝගයක් ලබා දී නොමැති හෝ දෙපාර්තමේන්තුව පිහිටුවීම හේතුවෙන් අභියාචනා විභාග කිරීම කම්කරු විනිශ්චය සභාව විසින් අත්හිටුවා ඇති නිලධරයෙකුට;

IV. යම් පටිපාටියක් හෝ විනය නීතියක් උල්ලංඝනය කිරීමකින් යම් අසාධාරණයකට ලක්ව ඇති නිලධරයෙකුට.

✓ වැඩිදුර තොරතුරු අවශ්‍ය වන්නේ නම් පහත සඳහන් දුරකථන අංක අමතන්න.
කේ.එම්.මාලනී කුමාරිහාමි, අධ්‍යක්ෂ (පාලන) - 0112887280,0703870002
එස්.ආර්.විජේසේකර, නියෝජ්‍ය අධ්‍යක්ෂ (විමර්ශන) – 0112 2879775, 071 4455148

ආර්.පී.බී.තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්,
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව,
4වන මහළ,
සෙත්සිරිපාය, බත්තරමුල්ල.